
(c) Sumitha Publishers

බරණැස් නුවර බ්‍රහ්මදත්ත රජ්ජුරුවන්ගේ මාලිගාවෙහි බල්ලෝ කීප දෙනෙක් වූහ. රජ්ජුරුවන් ඇති දැඩි කළ උසස් වර්ගයේ බල්ලන් නිසා මේ බල්ලෝ බොහෝ සැප සම්පත් ලැබූහ. බල්ලෝ ද ඉතා හුරතලයට හැදී වැඩුණාහ.

බරණැස් නගරයේ ද බොහෝ බල්ලෝ වූහ.
මේ බල්ලෝ වීදි පුරා ඇවිදිමින් කෑම සොයා ගෙන කෑහ.
රාත්‍රියෙහි දී නගරයෙන් පිට පාළු පෙදෙසක නිදා ගත්හ.
මේ බල්ලන්ට නායක වූ බල්ලෙක් ද සිටියේය.



(c) Sumitha Publishers



(c) Sumitha Publishers

එක් දිනක් රජතුමා ක්‍රීඩා සඳහා උද්‍යානයට ගියේය.
රජතුමා ගියේ එතුමාගේ මංගල රථයෙනි.
එය සුදු අසුන් යොදා අලංකාර ලෙස සරසන ලද රථයකි.
රජතුමා දවස පුරා ම උද්‍යාන ක්‍රීඩාවල යෙදුණේය.
හිරු බැස යන වේලෙහි නැවත මාලිගාව වෙත ආපසු ගියේය.